**කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව,**
**<u>මාතර දිස්ත්‍රික්කය.</u>**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු වත්කම් සංවර්ධනය සඳහා දැරූ වියදම් හා අවස්ථා කිහිපයකදී මිලදී ගත් උපකරණ සඳහා වැය කරන රු. 703,811 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කළයුතු වේ. | 2020 වර්ෂයට පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයේදි නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතුවේ. | 2020 වර්ෂයට පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයේදි නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය අනුව එකතුව රු.25,899,257 ක් වූ වෙනත් ආධාර ආදායම රු.25,982,510 ක් ලෙස දැක්වීම නිසා රු.83,313 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | හරස් සටහන් ගැලපීමට මඟ හැරීම නිසා සිදු වූ වෙනසකි. |

(ආ) නොසැසඳුනු ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.5,629,363 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.70,065 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරි වර්ෂ වලදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.42,676,170 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | ලේඛණ 02ක් මේ වන විට විධිමත්ව පවත්වා ගෙන යන අතර ඉදිරියේදී අනෙක් ලේඛන නිවැරදි කර ගැනිමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/ 15 හා 2007 මාර්තු 19 දිනැති ලිපිය | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දී සිදු කරන ලද සමීක්ෂණ මත දුන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | සමීක්ෂණ මණ්ඩලය ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් මායිම සම්බන්ධ ගැටලු පැන නැගුනෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,429,138 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.112,566 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,** බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් **හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2019** | | | | **2018** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,048,780 | 1,110,356 | 1,042,030 | 653,893 | 1,163,483 | 1,170,105 | 1,286,898 | 585,567 |
| කුලී | 3,537,000 | 1,975,340 | 2,869,255 | 243,120 | 3,694,250 | 2,328,555 | 2,561,282 | 1,137,035 |
| බලපත්‍ර ගාස්තු | 147,750 | 198,150 | 198,150 | 97,675 | 142,250 | 127,685 | 154,910 | 97,675 |
| වෙනත් ආදායම් | 6,748,500 | 6,745,434 | 3,099,098 | 15,117,840 | 31,470,680 | 27,863,514 | 21,505,934 | 11,471,504 |
| **එකතුව** | 11,482,030 | 10,029,280 | 7,208,533 | 16,112,528 | 36,470,663 | 31,489,859 | 25,509,024 | 13,291,781 |

## 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ වරිපනම් රු.430,852 ක් වූ අතර, රු. 451,167 ක් වූ වර්ෂයේ බිල්කිරීම් (ගාස්තු හා දඩ) සමඟ රු.882,019 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී අයවීම් රු.374,858 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.507,161 ක් හිඟ ශේෂයක් පැවතුණි. | වරිපනම් බදු හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා මේ වන විට අවසන් නිවේදන යොමු කර ඇත. |
| **(ආ) අක්කර බදු** | | |
| 2019 වර්ෂයේ සංශෝධිත ආරම්භක හිඟය රු.154,715 ක් වූ අතර, බිල් කිරීම් (ගාස්තු හා දඩ සමඟ) රු.12,311 විය. වර්ෂය තුළ මුළු අයවීම් රු.20,294 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.146,732 ක් හිඟව පැවතුණි. වර්ෂය ආරම්භයේ හිඟ ශේෂයෙන් සහ බිල්කිරීම් වලින් අයවීම් සියයට 12 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. | අක්කර බදු හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | අක්කර බදු නොගෙවන පුද්ගලයින් හට ලිපි මාර්ගයෙන් දැනුම් දීම් මඟින් හා ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර තොරතුරු නිවැරදි කර ගැනීමෙන් අනතුරුව මෙම හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරමි. |

## 2.2.3 වෙනත් ආදායම්

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.2,000 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.15,115,840 ක් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ හා හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ලැබිය යුතු මුදලින් මුද්දර ගාස්තු රු.2,457,500 ක් මේ වන විට ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන කරුණු සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් වේ. නමුත් තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකරගැනීමට වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්තවය හා සෞඛ්‍ය නංවාලීම් සඳහා දිගුකාලීන සැළසුම් සකස් කර නොතිබුණද 2020වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් 11 දින සභාවේ සැලසුම් කමිටුව විසින් අනුමත කර තිබුණු අංක 30/31/2017 දරන සංවර්ධන බලපත්‍රය ප්‍රකාරව වර්ග මීටර් 369 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අනුමැතිය ලබා දී තිබුණද, වර්ග මීටර් 1098 ක ගොඩනැගිල්ලක් ඉදිකර ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 දින ගැසට් නිවේදනයේ v වන උප වගන්තියේ 6 (ii) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | සංශෝධිත සැලැස්ම ලැබුණු පසු අංක 8/1597 හා 2009අප්‍රේල් 17වන ගැසට් පත්‍රය ප්‍රකාරව V වන උප වගන්තියේ 6 II යටතේ ආවරණ අනුමැතියට අදාළ දඩ මුදල් අය කර ගනිමි. |
| (ආ) | අංක 1597/8 හා 2009 අප්‍රේල් 07 දිනැති ගැසට් පත්‍රයේ v වන උපලේඛන 6 (ii) ප්‍රකාරව නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව සිදු කළ එකතුව වර්ග මීටර් 306.6 වූ ඉදිකිරීම් 02 ක් සම්බන්ධයෙන් අදාළ ගාස්තු අයකර විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර, සභාවට වාර්තා වී තිබුණු තවත් අනවසර ඉදිකිරීම් 03 ක් සම්බන්ධයෙන්ද ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ අංක 03/02/02/01 දරන හා අංක 2017 දෙසැම්බර් 19 දිනැති ලිපිය ප්‍රකාරව ආපදා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ලිපිය ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | 2020 වර්ෂය සඳහා ආපදා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| (අ) | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 02 ක් සම්පූර්ණ කර ගැනීමට හා 09 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම කළ යුතු වේ. | අතිරික්ත විධිමත් කර ගැනීම සඳහා සාධාරණීකරණ වාර්තා සමඟ යොමු කර ඇති අතර, පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් මැතිවරණ කටයුතු නිසා මේ වන විට තාවකාලිකව අත්හිටුවා ඇත. |
| | සේවක ණය | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට අය නොවී පවතින රු.1,106,650 ක් වූ සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් හිඟ ණය ශේෂ අයකර ගත යුතුවේ. | ලිඛිතව දැනුම් දී ඇති අතර මේ වන තෙක් එම මුදල් ලැබී නොමැත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පරිසර ආරක්‍ෂණ බලපත්‍ර ලබා නොගත් ආයතන 14 ක් පිළිබඳව සභාවේ අවධානය යොමු වී නොතිබුණු අතර, බලපත්‍ර ගාස්තු වශයෙන් රු.61,600 ක් අයකර ගෙන නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුවේ. | බලපත්‍ර ලබා නොගන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | අංක 2104 හා 2018 දෙසැම්බර් මස 28 දිනැති ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව දැන්වීම් පුවරු පිළිබඳ සමීක්‍ෂණයක් සිදුකර නොතිබූ අතර 2019 දෙසැම්බර් 13 වන දින වනවිට මාතර හක්මණ මාර්ගයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 57 ක් වෙනුවෙන් රු.82,525 ක ගාස්තු අයකර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020වර්ෂයේ සිට ගාස්තු අය කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතු පොදු වෙළඳපොල කඩ කාමර 18 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | ගිවිසුම් යාවත්කාලීන කළයුතුවේ. | ගිවිසුම් සම්බන්ධ ගැටළු සියල්ල ඉතා ඉක්මනින් නිවැරදි කරමි. |
| (ඇ) | පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක මාර/පපාසකො/සිට06/01/2019 හා 2019 නොවැම්බර් 27 දිනැති ලිපිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් ලෙස නම් කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණ ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i)වගන්තිය ප්‍රකාරව එම බල ප්‍රදේශය ගැසට් කර සියලු දේපල තක්සේරුකර වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | ඉදිරියේදී ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ප්‍රයෝජනයට නොගන්නා සභාව සතු මල්වතුගොඩ ප්‍රජා මණ්ඩල ගොඩනැගිල්ල අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගතයුතුවේ. | ඉදිරියේදී අලුත්වැඩියා කොට ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමි. |

**3.5.2 පවරානොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් 15 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම්වල අයිතිය පවරාගත යුතුවේ. | ඉඩම් 03ක අයිතිය පවරාගෙන ඇති බවත් අනෙක් ඉඩම් කඩිනමින් සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

### 3.5.3 නිෂ්ක්‍රිය/ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු අක්කර 01 රූඩ් 01 පර්චස් 24.1 ක් වූ ඉඩම් 11 ක් ඵලදායී කාර්යයකට යෙදවීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ඵලදායී කාර්යයක් සඳහා යොදාගත යුතුවේ. | කෙටිකාලීන බෝග වගාව සඳහා බදු දීම සඳහා 2019 වසරේදී අවස්ථා දෙකකදී ටෙන්ඩර් කළ අතර එහිදී ඉඩම් 03ක් පමණක් බදු ගැනුම්කරුවන් ඉල්ලුම්කර තිබූ අතර එම ඉඩම් 03 බදු දෙන ලද අතර ඉතිරි ඉඩම් ඉල්ලුම් කර නොතිබුණි. |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම්ගේ 2019 සැප්තැම්බර් 03 දිනැති ලිපිය අනුව සමාලෝචිත වර්ෂයේදී මාර්ග වලට ABC යොදා සංවර්ධනය කිරීමේදී රු.3,792 ක මිල අනුපාතය (රේට් ) භාවිතා නොකිරීම නිසා මාර්ග 04 ක් සඳහා රු.74,011 ක් වැඩිපුර ගෙවා තිබුණි. | නියමිත මිල අනුපාතයන් භාවිතා කළ යුතුවේ. | රඳවුම් මුදල් නිදහස් කිරීමේදී අඩු කර ගෙවීමට කටයුතු කරමි. |